# ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

## පිරිපහදුවේ රාත්‍රී රාජකාරිවල නියැලෙන සේවකයින් සඳහා කෙටි ආහාර සැපයීමේ ලංසු පත්‍රිකාව

**2026 / 2027**

**ටෙන්ඩර් අංකය REF - PD/SER/13/2026**

**කළමනාකාර (ව්‍යාපෘති),**
**ව්‍යාපෘති අංශය,**
**තෙල් පිරිපහදුව,**
**සපුගස්කන්ද.**


දුරකථන අංකය : **0117732977**
ෆැක්ස් : **0112106769**
ඊ – මේල් : **drm.mp@ceypetco.gov.lk**

**ලංසු කැඳවීමට ආරාධනාව**

**ලංකා ඛනිජ තෙල් සංස්ථාව**
**පිරිපහදු අංශය**

**<u>රාත්‍රී රාජකාරිවල නියැලෙන සේවකයින් සඳහා කෙටි ආහාර සැපයීම</u>**

# <u>ටෙන්ඩර් අංකය REF - PD/SER/13/2026</u>

ලංකා ඛනිජ තෙල් සංස්ථා පිරිපහදු කාර්යාංශය විසින් වසරක කාලයක් සඳහා "පිරිපහදුවේ රාත්‍රී රාජකාරි ඉටු කරන සේවකයින් සඳහා සංග්‍රහ සැපයීම" සඳහා සුදුසුකම් ලත් ලංසුකරුවන්ගෙන් ලංසු කැඳවනු ලැබේ.

ලංසුකරණය පිළිබඳ විස්තර තොරතුරු පිරිපහදු ව්‍යාපෘති අංශය වෙතින් ලබාගත හැකිවන අතර, ලංසු ලිපි ලේඛන ආපසු නොගෙවන රුපියල් දහසක (1000.00) ගාස්තුවක් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට ගෙවීමෙන් හා කළමනාකාර (ව්‍යාපෘති), ව්‍යපෘති අංශය, තෙල් පිරිපහදුව, සපුගස්කන්ද වෙත ලිඛිත අයදුම්පතක් (ඉල්ලීමක්) ඉදිරිපත් කිරීමෙන් අනතුරුව 2026.08.03 වන දින සිට 2026.08.14 වන දින දක්වා සාමාන්‍ය රාජකාරී දිනවලදී 09.00 පැයේ සිට 14.00 පැය දක්වා පමණක් කළමනාකාර (ව්‍යාපෘති), ව්‍යපෘති අංශය, තෙල් පිරිපහදුව, සපුගස්කන්ද. වෙතින් ලංසු ලිපිලේඛන ලබාගත හැකිය.

ලංසු අයදුම්පත් ඉදිරිපත් කිරීමේදි ආරක්ෂිත බැදුම්කරයක් (Tender Security) ලෙස ආපසු ගෙවන මුදලින් රුපියල් විසිපන් දහසක් (25,000.00) මුදලක් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව වෙත ගෙවීමෙන් හෝ එම වටිනාකමෙන් යුත් බැංකු ඇපකරයක් හෝ ලංසු අයදුම්පත සමඟ ඇමිණිය යුතුය. ලංසු අයදුම්පත් සමඟ ඉදිරිපත් කෙරෙන ආරක්ෂිත බැදුම්කරය 2026.12.19 දින දක්වා වලංගු විය යුතුය.

නිසි අයුරින් සම්පූර්ණ කර මුද්‍රා තබන ලද ලංසු අයදුම්පත් ලංසු භාරගන්නා අවසාන දිනය වන 2026.08.21 වන දින 14.00 පැයට පෙර පිරිපහදු කළමණාකාර කාර්යාලය (සපුගස්කන්ද) අසල තබා ඇති ලංසු පෙට්ටියේ තැන්පත් කිරීම මඟින් ලංසු ඉදිරිපත් කළ හැකිය. අදාල දිනයේ නියමිත වේලාවටම එම ලංසු විවෘත කරනු ලබන අතර, ඉහත වේලාව ඉක්මවා ගොස් ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරන බව ද දන්වමි. ලංසු විවෘත කරන අවස්ථාව සඳහා අදාල ලංසුකරුට හෝ ඔහු විසින් ලිඛිතව නම් කරනු ලබන එක් අයෙකුට පමණක් සහභාගි විය හැකිය. වැඩි දුරටත් අවශ්‍ය විස්තර ලංසු පත්‍රිකාවේ සඳහන්ව ඇත.

<u>සියළුම පැහැදිලි කර ගැනීම් සඳහා</u> **දුරකථන 011-7732977** මඟින් සපුගස්කන්ද පිරිපහදු ව්‍යාපෘති කාර්යාලයෙන් විමසිය හැකිය.

**කළමනාකාර (ව්‍යාපෘති),**
**ව්‍යපෘති අංශය,**
**තෙල් පිරිපහදුව,**
**සපුගස්කන්ද.**

## ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ
## තෙල් පිරිපහදුවේ කෙටි කෑම සැපයීම සම්බන්ධයෙන් ඇති කොන්දේසි

### 01. ලංසු අයදුම්කරන කරන ආකාරය

1.1 තෙල් පිරිපහදුවේ කෙටි කෑම සැපයීම සම්බන්ධයෙන් ඉල්ලුම් කිරීමේ දී රුපියල් දහසක (රු.1,000.00 ආපසු නොගෙවන තැන්පතු මුදලක් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව වෙත ගෙවා ලබා ගන්නා කුවිතාන්සිය ඉදිරිපත් කිරීමෙන් ලංසු තොරතුරු ලේඛනය ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ පිරිපහදු කාර්යාංශයේ ව්‍යාපෘති කළමණාකාරගෙන් ලබාගත හැකිය. එම ලේඛනයන් 2026.08.03 වන දින සිට 2026.08.14 දින දක්වා සාමාන්‍ය රාජකාරි දිනවලදී 09.00 පැයේ සිට 14.00 පැය දක්වා නිකුත් කෙරේ.

1.2 ඉදිරිපත් කරන ලංසුවල වලංගු කාලය 2026.11.19 දක්වා විය යුතුය.

1.3 ලංසු ඉදිරිපත් කිරීමේදි ආරක්ෂිත බැදුම්කරයක් (Tender Security) ලෙස ආපසු ගෙවන මුදලින් රුපියල් විසිපන් දහසක (25,000.00) මුදලක් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව වෙත ගෙවීමෙන් හෝ එම වටිනාකමෙන් යුත් මහ බැංකුව අනුමත කරන ලද බැංකුවකින් ලබාගත් බැංකු ඇපකරයක් ලංසු අයදුම්පත සමඟ ඇමිණිය යුතුය.

1.4 ලංසු අයදුම්පත් සමඟ ඉදිරිපත් කෙරෙන ආරක්ෂිත බැදුම්කරය (Tender Security) 2026.12.19 දින දක්වා වලංගු විය යුතුය.

1.5 මේ සඳහා තෝරාගනු ලබන ලංසුකරු තෙල් පිරිපහදුවේ සහ සපුගස්කන්ද බෙදා හැරීම් පර්යන්තයේ කෙටි කෑම සැපයීම වෙනුවෙන් කාර්යසාධක බැඳුම්කරයක් (Performance Security bond) ලෙස ගිවිසුම් කාලය අවුරුද්දක් දක්වා වලංගු වන පරිදි රුපියල් පනස් දහසක (රු.50,000.00 ක) ආපසු ගෙවන තැන්පතු මුදලක් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව නමින් මුදලින් තැන්පත් කිරීමෙන් හෝ එම වටිනාකමින් යුතු මහ බැංකුව අනුමත කරන ලද වාණිජ බැංකුවකින් ලබාගත් බැංකු ඇපකරයක් ලංසුකරු විසින් ඉදිරිපත් කළ යුතුය. එකී ඇප තැන්පතුව වෙනුවෙන් කිසිදු පොළියක් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් ගෙවනු නොලැබේ. ඔබ අයතනයේ සේවාව වසරක් පුරා අඛණ්ඩව සැපයිය යුතු අතර එසේ කිරීමට ඔබ අපොහොසත් වුවහොත් මෙම ගිවිසුම් කාලසීමාව අවසානයේදී තැන්පත් මුදල ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් ලංසුකරු වෙත නොගෙවීමට කටයුතු කරනු ලැබේ.

1.6 ලංසු බහාලන කවරයේ වම්පස "ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ තෙල් පිරිපහදුව සඳහා කෙටි කෑම සැපයිම සඳහා ලංසු අයදුම්පත 2026/2027 " යනුවෙන් සඳහන් කොට 2026.08.21 වැනි දින පස්වරු 2.00 ට පෙර ලැබෙන ලෙස මෙහි සඳහන් පරිදි පිරිපහදු කළමණාකාර කාර්යාලය (සපුගස්කන්ද) අසල අැති ලංසු පෙට්ටියේ බහාලිය යුතුය.

1.7 ලංසුකරු විසින් සේවය සැපයීම භාරගත් දින සිට වසරක (01) කාලයක් සඳහා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ තෙල් පිරිපහදුව වෙත සේවය සැපයීමට බැඳී සිටී.

1.8 ලංසුකරු ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සමඟ මාස 13ක කාලයක ගිවිසුමකට (ඇමුණුම් අංක 05) එළඹිය යුතුය.

1.9 නියමිත කාළසීමාව අවසන් වීමට පෙර ගිවිසුම අවසන් කිරීමට ලංසුකරු හෝ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ තෙල් පිරිපහදුව අදහස් කරන්නේ නම් එකී පාර්ශවය විසින් අනෙක් පාර්ශවය වෙත ඒ පිළිබඳව මාසයකට පෙර දැනුම් දිය යුතුය.

1.10 මෙම ගිවිසුම සම්බන්ධයෙන් ඇති වන සියළුම ප්‍රශ්න හා ගැටළු ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ පිරිපහදු කළමණාකාර වෙත ඉදිරිපත් කළයුතු අතර, එකී ප්‍රශ්න හෝ ගැටළු සම්බන්ධයෙන් ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් ගනුලබන තීරණය අවසාන තීරණය වේ.

## 02. ඇගයීම් නිර්ණායක

ශ්‍රී ලංකාවේ බේකරි නිෂ්පාදන මිලදී ගැනීමේදී 1980 අංක 26 දරන ආහාර පනත මගින් පාලනය වන සහ සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් බලාත්මක කරන ලද දැඩි ජාතික සෞඛ්‍ය රෙගුලාසි, තත්ත්ව සහතික සහ අමුද්‍රව්‍ය ප්‍රමිතීන් පිළිපැදිය යුතුය.

ලංසු අයදුම්පත සමඟ පහත සඳහන් තොරතුරු ඉදිරිපත් කල යුතුය.

1. මූලික තොරතුරු

   i. ලබා දිය හැකි ආහාර වර්ග සඳහන් පත්‍රිකාව (ඇමුණුම් අංක 01)
   ii. දිවුරුම් ප්‍රකාශය (ඇමුණුම් අංක 02)
   iii. රුපියල් 25,000 ක ආරක්ෂිත බැඳුම්කරයට අදාල රිසිට්පත
   iv. පසුගිය වසර තුනක (03) (2023-2025) කලයක් තුළ ලංසුකරු විසින් සපයන ලද සේවාවන් සහ අවම වශයෙන් ආයතන දෙකක් (02) පිළිබඳව අඛණ්ඩව වර්ෂයක කාලයක්වත් පවත්වා ගෙන යන ලද විස්තරයක් ලංසු අයදුම්පත සමඟ ඉදිරිපත් කළ යුතුය.

2. වෙනත් තොරතුරු

   i. බේකරි නිෂ්පාදන සඳහා අදාල ව්‍යාපාර ලියාපදිංචි සහතිකය හා ඊට අදාල බලපත්‍ර
   ii. බේකරි නිෂ්පාදනය වෙනුවෙන් ලැබී ඇති සහතිකපත් කුසලාන ආදිය
   iii. වෙනත් පැසසුම් ලිපි ආදිය
   iv. වෙනත් පිළිගත හැකි තොරතුරු

3. ලංසුකරු පිරිපහදු පරිශ්‍රයේ සිට කිලෝ මීටර් 02 දුර ප්‍රමාණයේ සිටිය යුතුය.

4. ලංසුකරු හට ඒක් බේකරියකට වඩා වැඩි ප්‍රමාණයක් තිබිය යුතුය.

5. ලංසුකරු විසින් ඉතා අඩු කාලයකින් පිරිපහදු වෙත කෙටි ආහාර ගෙනත් භාර දිමට හැකියාව තිබිය යුතුය. (උණුසුම්ව පිළිගැන්වීම සඳහා)

## 03. සැපයුම්කරු තෝරාගන්නා ආකාරය

මින් ඉහත අංක 1 මූලික තොරතුරු අතරින් අසම්පූර්ණ තොරතුරක් හෝ තොරතුරු ඉදිරිපත් කර තිබීමෙන් අයදුම්පත ප්‍රතික්ෂේප වනු ඇත.

එහෙත් අයදුම්කරුගේ විස්තර හා හැකියාව පිළිබඳව තාක්ෂණික ඇගයීම් කමිටුව සෑහීමකට පත් වන්නේ නම් ආරක්ෂිත බැදුම්කරය හැර සෙසු තොරතුරු අයදුම්කරුවන්ගේ දැනට පවත්වා ගෙන යනු ලබන බේකරි නිෂ්පාදන සිදු කරනු ලබන ස්ථානයේ ස්ථානීය පරික්ෂාවේ දී සිදුකරනු ලබන අධ්‍යයන තුලින් සහ පිරිපහදු කමිටුව විසින් ලබා දෙන වැඩිම ලකුණු අනුව සැපයුම් කරු තෝරා ගන්නා අතර සැපයුම් කරු හට සංස්ථාව විසින් ලබා දෙන සියළුම කොන්දේසි වලට ඒකඟ වීම තුලින් සැපයුම් කරු තෝරා පත්කර ගැනීම තහවුරු වේ.

## 04. සේවාවේ දෛනික කාර්යයන්

4.1 මෙම සේවාව සතියේ සෑම දිනකම ප.ව.19.00 පැයට කෙටි ආහාර ලබා දීමට කටයුතු කල යුතු අතර, ව්‍යවස්ථාපිත නිවාඩු දිනවලදීත්, විශේෂයෙන් ම අලුත් අවුරුදු නිවාඩු සමයේදීත්, ලබා දිය යුතුය. (වසරේ සෑම දිනකම මෙම සේවාව සැපයිය යුතුය)

4.2 ලංසුකරු විසින් ම මෙම සේවාව පවත්වාගෙන යායුතුය. කුමන හේතුවක් මත හෝ ලංසුකරු විසින් ඉන් කොටසක් පවත්වාගෙන යාමට වෙනත් පුද්ගලයෙකුට (Sub Contractor) පැවරීම නොකළ යුතුය. එවැනි පැවරීමක් සනාථ වුවහොත් වහාම කොන්ත්‍රාත්තුව අවසන් කරනු ලබන අතර, ලංසුකරු විසින් තැන්පත් කරනු ලබන මුදල නැවත ගෙවනු නොලැබේ.

4.3 ලංසුකරු විසින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ලිඛිත අවසරය කලින් ලබා නොගෙන කිසිදු දිනයක කෙටි ආහාර සැපයීම නතර නොකළ යුතුය. එසේ තාවකාලිකව හදිසි අවශ්‍යතාවයක් මත සේවය නැවත්වීමට අවශ්‍ය වන්නේ නම් ඒ සඳහා ලිඛිත අනුමැතිය දින හතකට (07)පෙර ලබා ගත යුතුය.

## 05. ආහාර සැපයීම හා ගෙවීම් පටිපාටිය.

5.1 ලංසු කරු විසින් ලබා දෙන සෑම කෙටි ආහාරයක්ම ඉදිරිපත් කර ඇති ආහාර වට්ටෝරුවට අනුව

ලබා දිය යුතු අතර, එම ආහාර වර්ග (ඇමුණුම් අංක 01) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ පිරිපහදුවේ රාත්‍රී සේවා මුර ක්‍රමයේ සිටින සේවකයින් සඳහා පමණක් බලපැවැත්වේ.

5.3 ලංසුකරු විසින් ලබා දිමට ඒකඟවන කෙටි ආහාර එකම මිලටම අදාල ගිවිසුම් කාලය සඳහා නොවෙනස්ව පැවතිය යුතුය.

5.4 ලංසුකරු විසින් ලබා දෙන කෙටි ආහාර සඳහා මාසයක් අවසානයේ චෙක්පත් මඟින් පමණක් ගෙවීම් කිරීමට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව බැඳී සිටී.

5.5 මේ සඳහා ලංසු කරු විසින් දෛනිකව පිරිපහදුව වෙත කෙටි ආහාර ලබා දීමේ වාර්තාපත් නඩත්තු කළ යුතු අතර මාසයක් අවසානයේ ඒය සංස්ථා නිලධාරියෙකු විසින් සහතික කළ යුතුය.

**06. කෙටි ආහාර නිසි ලෙස පිළියෙල කිරීමේ රෙගුලාසි,**

6.1 ආහාර පිළියෙල කිරීමට පෙර ඒවා නිසි පරිදි සෞඛ්‍ය ආරක්ෂිතව පිළියෙල කිරීමටත්, පිසන ලද ආහාර මැස්සන් සහ දූවිල්ලෙන් දූෂණය නොවන පරිදි සෞඛ්‍ය ආරක්ෂිතව ගබඩා කළ යුතුය.

6.2 ලංසුකරු විසින් සකස් කරන කෙටි ආහාර . තවද දිනපතා එකම වර්ගය ලබා නොදිය යුතු අතර, එය දිනපතා වෙනස් වර්ගයක් විය යුතුය.

6.3 සකස් කරන කෙටි ආහාර වර්ගවල විවිධත්වයක් සහිතව ආහාර සතියේ දින 07 සඳහා වර්ග 07 පිළියෙල කර ලබා දිය යුතුය.

6.4 ලංසුකරු විසින් ලබා දෙනු ලබන සෑම කෙටි ආහාරයක්ම, ගුණාත්මක, රසවත් හා පිරිසිදු තත්ත්වයෙන් පැවතිය යුතුය.

6.5 ශරීරයට අහිතකර රසකාරක සහ ආහාර කල්තබා ගැනීමේ ද්‍රව්‍යන් ආහාර පිසීමේදි භාවිතා නොකල යුතුවේ.

6.6 අවශ්‍ය ඕනෑම අවස්ථාවකදී ආයතනයේ වෛද්‍ය නිලධාරී, මහජන සෞඛ්‍ය නිලධාරී සහ රජයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීගේ පරීක්ෂාවට භාජනය වන අතර ඔවුනගේ මාර්ගෝපදේශයන්ට යටත්ව කෙටි ආහාර සැපයිය යුතුය.

**ඇමුණුම - 01**

**ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ තෙල් පිරිපහදුවේ**
**රාත්‍රී රාජකාරිවල නියැලෙන සේවකයින් සඳහා කෙටි ආහාර සැපයීමට අදාල මිල ගණන්**

**බේකරි අයිතමවල ලැයිස්තුව**

| අ.අ | බේකරි අයිතමය | එක් අයිතමයක මිල (රු;) |
|---|---|---|
| 01 | කිඹුලා බනිස් | |
| 02 | ටී බනිස් | |
| 03 | මාළු රෝල්ස් | |
| 04 | සුල්තානා බනිස් | |
| 05 | සීනි බනිස් | |
| 06 | ක්‍රීම්බනිස් | |
| 07 | මාළුබනිස්(මාලුපාන්) | |
| 08 | සොසේජස් බනිස් | |
| 09 | එළවළු රොටියක් | |
| 10 | මාළු රොටියක් | |
| 11 | බිත්තර රෝල්ස් | |
| 12 | හොට් ඩෝග්ස් | |
| 13 | මාළු පැටිස් 01 | |
| 14 | එළවළු පැටිස් 01 | |
| 15 | රිබන් කේක් කෑල්ලක් | |
| 16 | බටර් කේක් කෑල්ලක් | |
| 17 | මෆින් 01 | |
| 18 | ඩෝනට් 01 | |

**ඇමුණුම – 02**

## අයදුම්කරුගේ ප්‍රකාශය

................................................................................................ හි පදිංචි ....................................................................

වන මම මෙහි සඳහන් මූලික කොන්දේසි වලට යටත්ව ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ තෙල් පිරිපහදුවේ රාත්‍රී රාජකාරිවල නියැලෙන සේවකයින් සඳහා කෙටි ආහාර සැපයීමට එකඟ වන බවත්, මා විසින් සපයනු ලබන ආහාර වර්ග සඳහා මීට යාකර ඇති ලැයිස්තුවේ (ඇමුණුම් අංක 01) දැක්වෙන කෙටි කෑම වර්ග එකම මිලකට ලබා දීමට එකඟ වන බවත්, මෙම වගකීම් සඳහා අවශ්‍ය වන පරිදි රුපියල් පනස් දහසක (50,000,00) මුදලක් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව නමින් මුදලින් හෝ බැංකු ඇපකරයක් (Performance Bond) වශයෙන් තැන්පත් කරන බවත්, එමෙන්ම මාස 3 ක අධීක්ෂණ කාලයකට යටත්ව ගිවිසුමකට අත්සන් කිරීමට එකඟ වන බවත්, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ආරක්ෂාවට හා ගෞරවයට පටහැනි වන කිසිම ක්‍රියාවක් නොකිරීමට හෝ සිදුවන්නට ඉඩ නොතැබීමට වගබලා ගන්නා බවත්, ඉහත කරුණු එකක් හෝ කීපයක් මා වෙතින් කඩ වුවහොත් මා විසින් කර ඇති තැන්පතුවෙන් දඩ මුදල් ලෙස ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට අයකර ගතහැකි බව මා දන්නා බවත්, ඉහත ප්‍රකාශය කියවා බලා හොඳින් තේරුම් ගෙන අත්සන් තැබූ බවත්, මෙයින් සහතික කරමි.

..................................................................

ලංසුකරුගේ අත්සන

දිනය:- ......................................................

| | | |
|---|---|---|
| දුරකථන අංකය | : | .......................................................................... |
| ඊ මේල් | : | .......................................................................... |
| දිනය | : | .......................................................................... |
| ජාතික හැඳුනුම්පත් අංකය | : | .......................................................................... |

(ජාතික හැඳුනුම්පතේ පිටපතක් ඇමිනිය යුතුය)